# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1688/29 - 2011 ජනවාරි 14 වැනි සිකුරාදා - 2011.01.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1998 අංක 01 දරන ක්‍රීඩා (සංශෝධන) ප්‍රඥප්තිය මගින් සංශෝධිත 1993 අංක 01 දරන බස්නාහිර පළාතේ ක්‍රීඩා ප්‍රඥප්තියේ 04 (9) (ආ) ඡේදය යටතේ බස්නාහිර පළාත් සභාවේ සමූපකාර, වෙළඳ, ආහාර, ජල සම්පාදන, විදුලිය, ක්‍රීඩා, යෞවන, වනිතා සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සකස් කර 2002 මැයි මස 15 වැනි දින අංක 1236/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද අංක 08 (අ), (ආ) නියෝග පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ. මෙම නියෝග ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට බලාත්මක විය යුතුය.

හේවා මාතරගේ උපාලි කොඩිකාර,<br>
බස්නාහිර පළාත් ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ<br>
කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු,<br>
සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා<br>
බෙදාහැරීම් සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍ය.

2011 ජනවාරි මස 14 වැනි දින,<br>
කොළඹ දී ය.

නියෝග

08 (අ) අළුතින් ක්‍රීඩා සමාජ ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කිරීම වර්ෂයේ ඕනෑම දිනක සිදුකළ හැක.

(ආ) ලියාපදිංචි කර ඇති ක්‍රීඩා සමාජයන් හි ලියාපදිංචිය වාර්ෂිකව අළුත් කිරීම සඳහා එකී වාර්ෂික ලියාපදිංචිය අවසන්වන දින සිට ලිත් මසක් ඇතුළත පහත සඳහන් ලේඛන ද සමඟ ඉල්ලුම් කළ යුතුය :-

(i) ඉදිරි වර්ෂය සඳහා නිලධාරින් තේරීමට පැවැත් වූ නිලවරණ මහාසභා රැස්වීම් වාර්තාවල සහතික කළ පිටපත් 04ක් ;

(ii) ගත වූ වර්ෂයේ විගණනය කරන ලද ගිණුම් වාර්තාවේ පිටපත් 04 ක් ;

(iii) ඉදිරි වර්ෂයට තේරී පත් වූ නිලධාරි මණ්ඩලයේ නම් සහ ලිපිනයන් ;

(iv) කොට්ඨාස ක්‍රීඩා නිලධාරි විසින් සංවිධානය කරනු ලැබූ ක්‍රීඩා තරඟ, පුහුණු කඳවුරු, සම්මන්ත්‍රණ සඳහා සහභාගි වූ විස්තර ;

(v) නම් සහ ලිපිනයන් සමඟ සාමාජික නාම ලේඛනය.

01-697

1A - PG 001218— 380 (2011/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.